# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

''මිහිකත මැදුර'' ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர" காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல. ☎ 011 279 7400
"Mihikatha Medura" Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla 011 286 4051


මගේ අංකය / எனது இல / My No }

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 14.10.2025

චක්‍රලේඛ අංකය - 2025/02

සියළුම පළාත්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරුන්

## ඉඩම් අවසර පත්‍ර හා දීමනා පත්‍ර ලාභීන්ට රජයේ ඉඩම්වල පරම අයිතිය ලබාදීම සඳහා "හිමිකම" නිදහස් ප්‍රදාන පත්‍ර ලබාදීමේ වැඩසටහන

1969 අංක 16, 1981 අංක 27 හා 2022 අංක 11 දරන පනත් මගින් සංශෝධිත 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍ර හා දීමනා පත්‍ර මත ප්‍රදානය කර ඇති ඉඩම් සංවර්ධනය කරමින් භුක්ති විඳින ගොවි ජනතාව ප්‍රමුඛ මහජනතාවට තම ඉඩමෙහි පරම අයිතිය නොමැති වීමෙන් අදාළ භූමිය මානව අවශ්‍යතා සහ සංවර්ධන අවශ්‍යතාවයන්ට යොදවා ගැනීමේදීත් එම භූමිය ආර්ථික ඒකකයක් ලෙස සංවර්ධනය කිරීමේදීත් විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුව ඇත. එබැවින් එම ගැටළු අවම කර ගොවි ජනතාව ප්‍රමුඛ මහජනතාව අවසර පත්‍ර හා දීමනා පත්‍ර මත සංවර්ධනය කර භුක්ති විඳින ඉඩම්වල පරම අයිතිය ලබා දීම, පවතින නීති රාමුව තුළ ඉටුකිරීම අරමුණු කරගනිමින් එම ඉඩම්වල පරම අයිතිය ජනතාවට ප්‍රදානය කිරීම වෙනුවෙන් 2024 වර්ෂයේ දී ආරම්භ කරන ලද වැඩසටහන සමාලෝචනය සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා, අංක අමප/25/1259/808/024-1 හා 2025.07.14 දිනැතිව ගරු කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2025.07.21 දිනැතිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. එකී අනුමැතිය ප්‍රකාරව සංශෝධිත වැඩසටහන "හිමිකම" නමින් පහත පරිදි ක්‍රියාත්මක කෙරේ.

ඉහත කී අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි හිමිකම වැඩසටහන මගින්, දැනට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දී ඇති ඉඩම් වලට කොන්දේසි සහිතව නිකුත් කර ඇති අවසර පත්‍ර සහ දීමනා පත්‍ර වෙනුවට 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තියට අනුකූලව නිදහස් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව මා විසින් නිකුත් කර ඇති අංක 2023/01, හා 2023/01(ii) දරන චක්‍රලේඛ මෙමඟින් අවලංගු කරන අතර ඉහත කී හිමිකම වැඩසටහන සඳහා වන ක්‍රමවේදය පැහැදිලි කිරීම හා උපදෙස් ලබාදීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. එබැවින් පහත ක්‍රමවේදයන් හා පියවරයන් අනුගමනය කරමින් හිමිකම වැඩසටහන යටතේ ස්වකීය කැමැත්තෙන් අවසර පත්‍ර සහ දීමනා පත්‍ර රජයට භාරදෙන තැනැත්තන් වෙනුවෙන් නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය.


පාලන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 011 287 3033
ඉඩම් බදු / காணி குத்தகை / Land Lease ☎ 011 279 7423 011 287 3110
පර්යේෂණ හා සංවර්ධන / ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி / Research & Development ☎ 011 2874025 011 287 3812
ප්‍රතිපත්ති හා විමර්ශන / கொள்கை மற்றும் விசாரணை / Policy & Investigation ☎ 011 279 7482 011 2883635
ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 011 286 4462

ඊ-මේල් / ஈ-மெயில் E-mail – lcglandcom@gmail.com
වෙබ් ලිපිනය / இணையதள முகவரி Web Address – www.landcom.gov.lk

1. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර සහ 19(4) වගන්තිය යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍ර රජයට භාරගෙන නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීම

1.1. අවසර පත්‍ර/දීමනා පත්‍ර රජයට භාර ගැනීම

1.1.1. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ ලබාදී ඇති අවසර පත්‍රයක් හෝ 19(4) වගන්තිය යටතේ ලබාදී ඇති දීමනා පත්‍රයක් රජයට භාර දී නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන පුද්ගලයෙකුගේ ඉල්ලීම ඔබ විසින් ලිඛිතව ලබාගත යුතුය.

1.1.2. එලෙස ලැබෙන ඉල්ලීම්වලට අදාළව ඉදිරි කටයුතු සිදු කළ යුත්තේ, විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර එම ඉඩම ආරවුල් වලින් තොරව නිරවුල්ව භුක්ති විඳින බවට සෑහීමකට පත්වන අවස්ථා වලදී පමණි. එසේ සිදු කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණය සම්බන්ධව වාර්තා කිරීම සඳහා ඇමුණුම 06 ආකෘතිය භාවිතා කළ යුතුය.

1.1.3. එම ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අදාළ ඉඩම ආරවුල් වලින් තොරව නිරවුල් ලෙස භුක්ති විඳිනු ලබන බවට තහවුරු වන්නේ නම් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ ලබා දී ඇති අවසර පත්‍රය රජයට භාර ගැනීමට කටයුතු කළයුතු වන අතර ඒ සඳහා මෙම චක්‍රලේඛයේ **ඇමුණුම 01** ආකෘතිය භාවිතා කළ යුතුය. එය පිටපත් දෙකක් සහිතව භාර ගැනීමට කටයුතු කළ යුතු අතර මුල් පිටපත පරිලෝකනය(scan) කර e-Slims පද්ධතියට ඇතුලත් කර ඉල්ලුම්කරු වෙත භාරදීමටත්, අනෙක් පිටපත ගොනු කර තැබීමටත්, කටයුතු කළ යුතුය. ඉන් අනතුරුව **"නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමට ස්වකීය කැමැත්තෙන් රජයට භාරදෙන ලද අවසර පත්‍රයකි."** ලෙස අවසර පත්‍රයේ හා ලෙජර් පිටුවේ සටහනක් යෙදිය යුතුය. එයට අදාළව නිදහස් ප්‍රදාන පත්‍රය සකසා ලියාපදිංචි කර ප්‍රදාන පත්‍ර කරුට භාර දුන් පසුව නිදහස් ප්‍රදාන පත්‍රයේ අංකය ලෙජර් පිටුවේ සටහන් කර ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්ගේ අත්සන සහ නිල මුද්‍රාව සහිතව ලෙජර් පිටුව අවලංගු කිරීමට කටයුතු කළ යුතුය.

1.1.4. එමෙන්ම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වන වගන්තිය යටතේ ලබා දී ඇති දීමනා පත්‍රය රජයට භාර ගැනීමට මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය භාවිතා කළ යුතුය. එය පිටපත් තුනකින්(03) සකස් කළ යුතු අතර එක් පිටපතක් පරිලෝකනය(scan) කර e-Slims පද්ධතියට ඇතුල් කර, එම පිටපත වෙනම ගොනුකර තැබිය යුතුය. ඉතිරි පිටපත් දෙකෙන් එක් පිටපතක් ඉල්ලුම්කරු වෙත භාරදීමටත්, අනෙක් පිටපත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමටත් කටයුතු කළ යුතුය.

1.1.5. එලෙසම අදාල දීමනා පත්‍රකරු හෝ අවසර පත්‍රකරුගේ කලත්‍රයා, සාරෝපිත උරුමකරු[1], භුක්ති විඳිනු ලබන උපලේඛනගත උරුමකරු/උරුමකරුවන් විසින් මෙම ඉඩම රජයට භාරදී නැවත රජයේ ඉඩම් ආඥා පනත යටතේ වන නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීම තුළින් ඔවුන් සතුව එම ඉඩම සඳහා පැවති අයිතිවාසිකම අත්හැරීම මෙන්ම නැවත ඔවුන්ට නොමිලේ රජයේ ඉඩමක් ලබාගැනීමට ඉල්ලුම් කිරීමට ඇති හැකියාව අහිමි වන බව අවබෝධ කරගෙන එය පිළිගනිමින් එකඟ වූ බවට වන කැමැත්ත ඇමුණුම 07 ආකෘතිය භාවිතා කරමින් සම්පූර්ණ කළ යුතුය. එය එක් පිටපතකින් සකස් කළ යුතු අතර එහි පරිලෝකන(scan) පිටපත e-Slims පද්ධතියට ඇතුළත් කර, දෘඪ පිටපත වෙනම ගොනුකර තැබිය යුතුය.

## 1.2. සුදුසුකම් ලැබූ අවසර පත්‍ර / දීමනා පත්‍ර සඳහා "O" රේඛා චිත්‍ර ලබාගැනීම

1.2.1. ඉහත පියවරයන් සම්පූර්ණ කරන ලද ඉල්ලීම් e-Slims පද්ධතියට නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීම සඳහා වන අයදුම්පතක් ලෙස ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කිරීමෙන් පසු පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

1.2.2. එලෙස පද්ධතිය මගින් අයදුම්පත යොමු කිරීමේදී ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ ලබාදුන් පසු නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීම සඳහා අවශ්‍ය " O " රේඛා චිත්‍ර, ඉල්ලුම් කිරීම සඳහා වන ආ.ඒ.ආ.118 ආකෘතිය මගින් වන මැනුම් ඉල්ලීම ස්වයංක්‍රීයව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත යොමු වනු ඇත.

1.2.3. තවද මෙම ඉල්ලීම් වලට අදාළව කැබලි විස්තර ලැයිස්තුවේ යම් සංශෝධනයක් සිදුකිරීමට අවශ්‍ය නම් එම සංශෝධන ද සහිතව ආ.ඒ.ආ. 08 ආකෘතිය භෞතිකව සම්පූර්ණ කර මැනුම් ඉල්ලීමක් යොමු කර පද්ධතියට ඇමුණුමක් ලෙස ඇතුළත් කළ යුතුය.

## 1.3. රජයේ ඉඩම් ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ පරම අයිතිය සහිත නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීම

ඉහත 1.2 අනුව ඔබ විසින් යොමු කරනු ලබන නිදහස් ප්‍රදාන පත්‍ර ඉල්ලුම්පත සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ පරම අයිතිය සහිත නිදහස් ප්‍රදාන පත්‍රය මා විසින් සකස් කර ඉඩම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මඟින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 03 වන වගන්තිය යටතේ පැරණි ප්‍රදානපත්‍රය අවලංගු කර, රජයේ ඉඩම් ආඥා

---

[1] මෙහිදී සාරෝපිත උරුමකරු වශයෙන් සැලකිය යුත්තේ අදාල දීමනා පත්‍ර කරු හෝ අවසර පත්‍ර කරු හා ස්වකීය කලත්‍රයා විසින් ඉඩම රජයට භාර දෙනු ලබන අවස්ථාවේදී ඉඩම් සංවර්ධන ආඥා පනත ප්‍රකාරව ඉඩමේ හිමිකම සාරෝපණය වන සාරෝපිත උරුමකරුවා හෝ උරුමකරුවන්ය.

පනතේ 02 වන වගන්තිය යටතේ ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගෙන එකී පනතේ 23(2) වගන්තිය යටතේ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන සහ රාජ්‍ය මුද්‍රාව පිහිටුවා නිදහස් ප්‍රදාන පත්‍රය මා වෙත යොමු කිරීමෙන් අනතුරුව මා විසින් ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් වෙත යොමු කරනු ලැබේ.

### 1.4. නිදහස් ප්‍රදාන පත්‍රය ලියාපදිංචි කිරීම

මා විසින් ප්‍රාදේශීය ලේකම් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් වෙත යොමු කරනු ලැබූ නිදහස් ප්‍රදාන පත්‍රය මෙම චක්‍රලේඛයේ ඇමුණුම 03 භාවිතා කරමින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා යොමු කළ යුතුය. එහිදී නිදහස් ප්‍රදාන පත්‍රය නිකුත් කරනු ලබන්නේ පෙර ලියාපදිංචිය සහිත දීමනා පත්‍රයක් සඳහා නම් එම දීමනා පත්‍ර අංකය හා පෙර ලියාපදිංචි විස්තර උක්ත ඇමුණුම 03 ආකෘතියේ නිවැරදිව සඳහන් කිරීමට කටයුතු කළ යුතුය.

## 2. හිමිකම නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීම සඳහා අවසර පත්‍ර/දීමනා පත්‍ර භාර නොගත යුතු අවස්ථා

ඉහත 1.1 යටතේ අවසර පත්‍ර හා දීමනා පත්‍ර රජයට භාරගැනීමේ දී පහත සඳහන් කාණ්ඩයන් යටතට ගැනෙන අවසර පත්‍ර හෝ දීමනාපත්‍ර සම්බන්ධයෙන් නිදහස් ප්‍රදාන පත්‍ර සැකසීමට අදාළ කාර්යයන් **නොකිරීමට සැළකිලිමත් විය යුතුය.**

- ජීවිත භුක්තිය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍ර හා දීමනාපත්‍ර මත නිදහස් ප්‍රදාන පත්‍ර ඉල්ලුම් කිරීම
- ගොවි පන්තිය යටතේ වගාවට හෝ පදිංචියට හෝ වගාව හා පදිංචියට ලබාදී ඇති ඉඩම් වෙනත් අරමුණු සඳහා භාවිතා කිරීම
- මධ්‍යම පන්තික වැඩසටහන යටතේ බැහැර කර ඇති ඉඩම්
- නිරවුල්ව ඉඩම භුක්ති නොවිඳීම
- ඉඩම මැනුම් කටයුතු කර නොමැති වීම
- මූල්‍ය ආයතනයකට හෝ බැංකුවකට ඉඩම උකස් කර තිබීම
- අවසර පත්‍රයක් මත නිදහස් දීමනා පත්‍ර ඉල්ලුම්කරන විට අවසර පත්‍රය නිකුත් කර ඇත්තේ මඩ ඉඩමක් සඳහා නම් වසර තුනක් ද ගොඩ ඉඩමක් සඳහා නම් වසරක් ද ගතව නොමැති වීම
- බැහැර කර ඇති ඉඩම් වල නෛතික ගැටළු පැවතීම
- නාගරික බල ප්‍රදේශයක් ලෙස ගැසට් කිරීමෙන් පසු ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍ර නිකුත් කර තිබීම
- මෙම කැබිනට් අනුමැතිය ලබාදෙන ලද 2025.07.21 දිනෙන් පසු අවසර පත්‍ර මගින් සිදු කරන බැහැර කිරීම්

ඒ අනුව ඉහත ගැටළුකාරී තත්ත්වයන් පවතින, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වන වගන්තිය යටතේ වන අවසර පත්‍ර හා 19 (4) වගන්තිය යටතේ වන දීමනා පත්‍ර සඳහා හිමිකම වැඩසටහන යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කළ යුත්තේ එකී නිරාකරණය කළ හැකි ගැටළු නිරාකරණය කිරීමෙන් අනතුරුවය. එම ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉල්ලුම් කරුවන් වෙත නිදහස් ප්‍රදාන පත්‍ර ලබාදීමේ කටයුතු

කඩිනම් කිරීමට ප්‍රාදේශීය ලේකම්/පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් විසින් වග බලා ගත යුතුය.

## 3. නිදහස් ප්‍රදාන පත්‍ර ලබාගැනීමේ එකඟතාව මත රජයට භාරදෙන ලද අවසර පත්‍ර හා දීමනා පත්‍ර, රජයට භාරදීම අවලංගු කර නැවත බලාත්මක කිරීම.

3.1. නිදහස් ප්‍රදාන පත්‍ර ලබාගැනීමේ එකඟතාව මත රජයට භාරදී ඇති, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) හා 19(4) වගන්ති යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර හා දීමනා පත්‍ර එම හිමිකරුවන්ගේ විවිධ අවශ්‍යතා මත හෝ ඉහත 2හි සඳහන් හේතු මත නිදහස් ප්‍රදානපත්‍ර සැකසීමේ ඉදිරි කටයුතු සිදු කළ නොහැකි විට රජයට භාරදීම අවලංගු කර නැවත බලාත්මක කිරීමට සිදුවන අවස්ථා වලදී පහත පරිදි කටයුතු කළ යුතුය.

3.1.1. අවසර පත්‍ර පිළිබඳව කටයුතු කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ඇමුණුම 04 පිටපත් 2කින් ලබාගෙන අදාල ලෙජර් පිටුවේ අවසර පත්‍රය බලාත්මක කිරීම පිළිබඳ සටහන් තැබීමෙන් අනතුරුව සම්පූර්ණ කරන ලද ඇමුණුම 04 හි එක් පිටපතක් අවසර පත්‍රකරුට ලබා දී අනෙක් පිටපත ඔබ කාර්යාලයේ ගොනුකර තබා ගත යුතු වේ. ඉන් අනතුරුව අවසර පත්‍රය අවසර පත්‍රකරුට ලබා දීමට කටයුතු කළ යුතුය.

3.1.2. දීමනා පත්‍ර පිළිබඳ කටයුතු කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ඇමුණුම 05 පිටපත් 03 කින් භාවිත කර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කර පත්ඉරුවේ ලියාපදිංචි කරන ලෙසත් සම්පූර්ණ කරන ලද ඇමුණුම 05 හි එක් පිටපතක් දීමනා පත්‍රකරුට ලබා දී අනෙක් පිටපත කාර්යාලයේ ගොනු කර තබා ගැනීමට කටයුතු කළ යුතු වේ. ඉන් අනතුරුව දීමනා පත්‍රය දිමනා පත්‍රකරුට භාරදීමට කටයුතු කළ යුතුය.

3.2. අවසර පත්‍ර හා දීමනා පත්‍ර රජයට භාර ගැනීමෙන් අනතුරුව අවසර පත්‍ර කරු/දීමනා පත්‍ර කරු මියගොස් ඇති අවස්ථා වල දී ජීවිත භුක්තිකරු හෝ ජීවිත භුක්තිකරු නොමැති අවස්ථා වලදී උරුමකරු මඟින් ඉහත ආකෘති පත්‍රයන් භාවිත කර රජයට භාර ගැනීම අවලංගු කර රජයට භාරදෙන ලද දීමනා පත්‍ර/අවසර පත්‍ර නැවත බලාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි වේ.

3.3. එමෙන්ම ඇමුණුම 04 සහ ලියාපදිංචි කරන ලද ඇමුණුම 05 සමඟ දීමනාපත්‍රය /අවසර පත්‍රය නැවත හිමිකරු වෙත භාරදීමේ දී, ඒ සම්බන්ධව විධිමත් පරිදි ලේඛන පවත්වා ගැනීමට ද වගබලා ගත යුතු වේ.

## 4. රජයේ ඉඩම් ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිදහස් ප්‍රදාන පත්‍ර සම්බන්ධ පසු කටයුතු

මෙම වැඩසටහන යටතේ රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන නිදහස් ප්‍රදාන පත්‍ර රජයේ අයිතියෙන් බැහැර වන බැවින් මෙම නිදහස් ප්‍රදාන පත්‍ර සම්බන්ධව පසු කටයුතු කිරීම සාමාන්‍ය නීතිය යටතේ

සිදු කළ යුතුය. එහෙත් පරිපාලනමය දෝෂ මත නිදහස් ප්‍රදාන පත්‍රවල සංශෝධන සිදුකළ යුතු වන්නේ නම් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

## 4.1. නිදහස් ප්‍රදාන පත්‍රවල වරද නිවැරදි කිරීම.

4.1.1. රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍රයක වරද නිවැරදි කිරීම සඳහා එම පනතේ 20 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇත. එයට අංක 7 දරන රෙගුලාසිය ද අදාළ වන අතර මේ පිළිබඳව ඉඩම් නියෝග 210 මඟින් විස්තර කර ඇත.

4.1.2. ඒ අනුව නිදහස් ප්‍රදාන පත්‍රයකින් හෝ රීට අමුණා ඇති රේඛා චිත්‍රයක හෝ කිසියම් ලිපි දෝෂයක් මත සිදුවන වරදක් පවතින බව අනාවරණය වුවහොත් එම වරද පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක්ද සමඟ නිදහස් ප්‍රදාන පත්‍රය නිවැරදි කිරීම සඳහා නැවත මා වෙත යොමු කළ යුතුය.

## 4.2. ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප අත්සන පිහිටුවීමට පෙර නිදහස් ප්‍රදාන පත්‍ර කරු මිය ගිය අවස්ථාවකදී කටයුතු කළ යුතු ආකාරය

4.2.1. ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප අත්සන පිහිටුවීමට පෙර නිදහස් ප්‍රදාන පත්‍ර ලාභියා මියගිය අවස්ථාවක නිදහස් ප්‍රදාන පත්‍රයේ නීතිමය වලංගුභාවයක් නොමැති බැවින් ප්‍රමාණවත් තොරතුරු ලබාදීමෙන් පසු මෙම නිදහස් ප්‍රදාන පත්‍රය අවලංගු කරවා ගැනීමට පහත පරිදි ක්‍රියා කළ යුතු වේ.

- මියගිය පුද්ගලයාත් ප්‍රදාන පත්‍රකරුත් එකම පුද්ගලයකු බවට සහතික කර, මියගිය ප්‍රදාන පත්‍ර කරුගේ මරණ සහතිකය ද සමඟ හිමිකම නිදහස් ප්‍රදාන පත්‍රය හා එහි කාර්යාල පිටපත් අදාළ පරිදි පළාත් ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත යොමුකළ යුතුය. එසේ මා වෙත යොමු කරනු ලබන නිදහස් ප්‍රදාන පත්‍රය ජනාධිපතිවරයා වෙත යොමුකර අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.
- එවැනි අවස්ථාවක දී නිදහස් ප්‍රදාන පත්‍රය සකස් කර ඇත්තේ දීමනා පත්‍රයක් මත නම් ඒ වන විට දීමනා පත්‍රය ද අවලංගු කර ඇති බැවින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කලත්‍රයා වෙත ජීවිත භුක්තිය හෝ අනුප්‍රාප්තිකයා වෙත මුල් අයිතිය ලබා දී ඒ බව ලෙජර් පිටුවේ සටහන් තැබිය යුතුය.
- ඉහත අවස්ථාවේ දී අනුප්‍රාප්තිකයෙකු වෙත මුල් අයිතිය ලබාදුන්නේ නම් එම අය වෙත නිදහස් ප්‍රදාන පත්‍රය සකස් කිරීම සඳහා ඉහත පියවර අනුගමනය කරමින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

5. නිදහස් ප්‍රදාන පත්‍ර ලබා ගැනීම වෙනුවෙන් මේ වනවිට e-Slims පද්ධතියට ඇතුළත් කර නිදහස් ප්‍රදාන පත්‍ර සැකසීමේ කටයුතු අවසන් නොවූ අයදුම්පත් පිළිබඳව කටයුතු කිරීම.

5.1. මෙම අයදුම්පත් ඉහත 1 හි දක්වා ඇති පියවරයන් අනුගමනය කරමින් අවශ්‍ය යාවත්කාලීන කිරීම් සිදුකිරීම සඳහා නැවත e-Slims පද්ධතිය මගින් ඔබ වෙත යොමු කරන අතර ඒ අනුව අදාළ කටයුතු සිදු කර එම අයදුම්පත් නැවත මා වෙත යොමු කළ යුතුය.

**5.2.** මෙම වැඩ සටහන සඳහා දැනට e-Slims පද්ධතියට ඔබ විසින් ඇතුළත් කර ඇති දීමනා පත්‍ර/අවසර පත්‍ර සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බැවින් මා විසින් නැවත දැනුම් දෙන තුරු මෙම වැඩ සටහනට දීමනා පත්‍ර/අවසර පත්‍ර භාර ගැනීම හෝ e-Slims පද්ධතියට නව ඇතුළත් කිරීම් සිදු නොකළ යුතුය.

5.3. තවද හිමිකම වැඩසටහන යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම සම්බන්ධව පද්ධතියේ සිදුකරනු ලබන වෙනස්කම් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳව අවශ්‍ය මාර්ගෝපදේශයන් මෙම චක්‍රලේඛයට සමගාමීව ලබා දීමට කටයුතු කෙරෙනු ඇත.

5.4. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) හා 19(4) වගන්ති යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර හා දීමනා පත්‍ර මත පදනම්ව සකස් කරනු ලබන "හිමිකම" නිදහස් ප්‍රදාන පත්‍ර ලියාපදිංචි කිරීම සම්බන්ධව 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව කටයුතු කරන අවස්ථාවන්හි දී ඊට අදාළ මාර්ගෝපදේශ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් මෙම චක්‍රලේඛයට සමගාමීව නිකුත් කරනු ඇත.

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මා වෙතින් විමසීම කළ හැකි වේ.

**චන්දන රණවීර ආරච්චි**
**ඉඩම් කොමසාරිස් ජනරාල්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
4. ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
7. ලේකම්, පරිසර අමාත්‍යාංශය
8. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්

} කරු.දැ.ගැ.ස සහ අ.ක.ස

9. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
10. සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්
11. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
12. කොමසාරිස් ජනරාල්, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
13. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
14. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව
15. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
18. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
19. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
20. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
21. සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
22. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
23. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
24. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය

කරු.දැ.ගැ.ස සහ අ.ක.ස

ඇමුණුම 01

**1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින් හා 2022 අංක 11 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් සඳහා නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත රජයට භාරදීම**

.............................................................. පළාතේ ...................................................... දිස්ත්‍රික්කයේ, ...................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ...................................................... ග්‍රාම නිලධාරී වසමේ, ............................................................................................................................................... ලිපිනයේ පදිංචි ............................................................................................................................................... වන මම,
(අවසරපත්‍රකරුගේ නම)
මා වෙත ලැබී ඇති ............................................ අංක දරණ අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත අද දින එකී ...................................... අංක දරණ අවසර පත්‍රය ස්වකීය කැමැත්තෙන් ආපසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාරදෙමි.

අවසර පත්‍රකරුගේ අත්සන :- ................................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ................................................

දිනය:-.........................................

ඉහත කී අවසර පත්‍රය අද දින භාර ගනිමි.

........................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

එකී ඉඩමේ උපලේඛණය

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

...........................................................................................................................................

| අවසර පත්‍ර අංකය | නිකුත් කළ දිනය | ලෙජර් අංකය හා පිටු අංකය |
|---|---|---|
| .................................. | .............................. | .................................. |

ඇමුණුම 02

මගේ අංකය - ............................................
දෙදහස්..............................මස................දින,
..................................... කාර්යාලයේ දීය.

දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්,

..................................

**1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින් හා 2022 අංක 11 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) වගන්තිය යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍රය නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත රජයට භාරදීම ලියාපදිංචි කිරීම**

............................................................පළාතේ.................................................දිස්ත්‍රික්කයේ, ...................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ......................................................ග්‍රාම නිලධාරී වසමේ, ...................................................................................................................... ලිපිනයේ පදිංචි .................................................................................................................. වන මම

(දීමනාපත්‍රකරුගේ නම)

මා වෙත ලැබී ඇති .......................................අංක දරන දීමනා පත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත අද දින එකී ...................................... අංක දරන දීමනා පත්‍රය ස්වකීය කැමැත්තෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාරදෙමි.

දීමනා පත්‍රකරුගේ අත්සන :- ....................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ..................................

ඉහත කී දීමනා පත්‍රය අද දින භාර ගනිමි.

.........................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

<u>එකී ඉඩමේ උපලේඛණය</u>

...................................................................................................................................
...................................................................................................................................
...................................................................................................................................
.................................................................................................................

| දීමනාපත්‍ර අංකය | පෙර ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| ................................ | ................................ | ................................ |

ඇමුණුම 03

මගේ අංකය - ..............................................
දෙදහස්..............................මස................දින,
..................................... කාර්යාලයේ දීය.

දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්,

.....................................

1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ලබා දෙන ලද නිදහස් ප්‍රදාන පත්‍රය ලියාපදිංචි කිරීම

මෙහි පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් ඉඩම් කොටස සඳහා "හිමිකම වැඩසටහන" යටතේ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ..............................අංක දරන නිදහස් ප්‍රදාන පත්‍රය ........................................................................................................................ ලිපිනයෙහි පදිංචි ................................................................................ (නම) යන අය වෙත ............................... දිනැතිව ලබා දී ඇති බැවින් මෙම ඉඩම ලියාපදිංචි කිරීමට කටයුතු කරන්න.

උපලේඛණය

(රේඛා චිත්‍ර අංකය O/....../............)

..................................... පළාතේ .......................................... දිස්ත්‍රික්කයේ ..................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ................................... ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ............................... යන ගමෙහි පහත දැක්වෙන මායිම් ඇතුළත පිහිටියා වූ ද අංක .................................. වැනි ක්ෂේත්‍ර පත්‍රයෙහි .........................................දරන පිඹුරෙහි කැබලි අංක ............................ වශයෙන් පෙන්වා ඇති හෙක්ටයාර්..........................................................................................(හෙක්. .............................) විශාල ..................................නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් ඉඩම් කොටස වේ.

එකී මායිම් -

උතුරට :

නැගෙනහිරට :

දකුණට :

බටහිරට :

---

පෙර ලියාපදිංචි කර ඇත/නැත

පෙර ලියාපදිංචි කර තිබේනම්,

උක්ත උපලේඛණයේ දැක්වෙන ඉඩම පහත දැක්වෙන දීමනා පත්‍ර අංකය මගින් පෙර ලියාපදිංචි කර ඇති අතර එම ලියාපදිංචිය අවලංගු කිරීමට ද කටයුතු කරන්න.

| දීමනාපත්‍ර අංකය | පෙර ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| ................................ | .................................. | ................................ |

.......................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

ඇමුණුම 04

මගේ අංකය - ...............................................

දෙදහස්...............................මස.................දින,

....................................... කාර්යාලයේ දීය.

ප්‍රාදේශීය ලේකම් ,

**හිමිකම වැඩසටහන යටතේ, නිදහස් දීමනාපත්‍රයක් නිකුත් කිරීමේ එකහතාවය මත රජයට භාර දී ඇමුණුම 02 මඟින් ලියාපදිංචි කරන ලද 1969 අංක 16 දරන පනතින් , 1981 අංක 27 දරන පනතින් හා 2022 අංක 11 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය රජයට භාරදීම අවලංගු කර නැවත බලාත්මක කර ලියාපදිංචි කිරීම.**

....................................... පළාතේ ............................................ දිස්ත්‍රික්කයේ ............................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .................................... ග්‍රාම නිලධාරී වසමේ .................................... ...........................................................................................................................ලිපිනයේ පදිංචි ....................................................................................................................................

(අවසර පත්‍රකරුගේ නම)

මා/ යන අය වෙත ලැබී ඇති ....................................අංක දරන අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 02 වගන්තිය යටතේ නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමේ එකහතාවය මත ......................................... දින මාගේ අවසර පත්‍රය ස්වකීය කැමැත්තෙන් ආපසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාර දුන් අතර මාගේ පුද්ගලික අවශ්‍යතාවය මත/ අවසර පත්‍රකරු මිය ගොස් ඇති බැවින් නැවත එම භාරදීම අවලංගු කර මා වෙත .................................. අංක දරන ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

අවසර පත්‍රකරුගේ/ ජීවිත භුක්තිකරුගේ/ උරුමකරුගේ අත්සන :-

ජාතික හැඳුනුම්පත් අංකය :-

ශ ඉල්ලීම නිර්දේශ කර ............................ දින අංක .............................. ලෙජරයේ .......................... අංක දරන අවසර පත්‍රය රජයට භාරගැනීමට ඇමුණුම 01 අනුව ලෙජරයේ සටහන් කර ඇති අතර, එම සටහන අවලංගු කර නැවත .................................. අවසර පත්‍රය බලාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදෙමි.

එකී ඉඩමේ උප ලේඛනය

..................................................................................................................................................................................

..................................................................................................................................................................................

..................................................................................................................................................................................

..................................................................................................................................................................................

..................................................................................................................................................................................

..................................................................................................................................................................................

..................................................................................................................................................................................

..............................................................................

ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්

අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

ඇමුණුම 05

මගේ අංකය - ..............................................

දෙදහස්...............................මස................දින,

..................................... කාර්යාලයේ දීය.

ප්‍රාදේශීය ලේකම්

හිමිකම වැඩසටහන යටතේ, නිදහස් දීමනා පත්‍රයක් නිකුත් කිරීමේ එකඟතාවය මත රජයට භාර දී ඇමුණුම 02 මගින් ලියාපදිංචි කරන ලද 1969 අංක 16 දරන පනතින් , 1981 අංක 27 දරන පනතින් හා 2022 අංක 11 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) වගන්තිය යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍රය රජයට භාරදීම අවලංගු කර නැවත ලබා ගැනීම.

..................................... පළාතේ .......................................... දිස්ත්‍රික්කයේ ...............................................
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .................................. ග්‍රාම නිලධාරී වසමේ .................................
.................................................................................................................................ලිපිනයේ
පදිංචි ...................................................................................................................................

(දීමනා පත්‍රකරුගේ නම)

මා/ යන අය වෙත වෙත ලැබී ඇති ........................... අංක දරන දීමනා පත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 02 වගන්තිය යටතේ නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත ................................... දින මාගේ දීමනා පත්‍රය ස්වකීය කැමැත්තෙන් ආපසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාර දුන් අතර මාගේ පුද්ගලික අවශ්‍යතාවය මත / දීමනා පත්‍රකරු මිය ගොස් ඇති බැවින්/නිදහස් දීමනා පත්‍රයක් ලබාගැනීම සඳහා සුදුසුකම් සපුරා නොමැති බැවින් නැවත එම භාරදීම අවලංගු කර මා වෙත .................................... අංක දරන ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

දීමනා පත්‍රකරුගේ/ජීවිත භුක්තිකරුගේ/ උරුමකරුගේ අත්සන :-

ජාතික හැඳුනුම්පත් අංකය :-

දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්,

ඉහත ඉල්ලීම අනුමත කරන අතර ..................................... පත්ඉරුවේ .................................... අංක දරන දීමනා පත්‍රය රජයට භාරගැනීමට ඇමුණුම 02 අනුව .............................. දින ලියාපදිංචි කර ඇති අතර එම ලියාපදිංචිය අවලංගු කර නැවත ..................................... අංක දරන දීමනා පත්‍රයේ පූර්ව ලියාපදිංචිය වලංගු කරන ලෙස කාරුණිකව දන්වා සිටී.

එකී ඉඩමේ උප ලේඛනය

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

මෙම ප්‍රදාන පත්‍රයෙහි ලියාපදිංචිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රදාන පත්‍ර අංකය | ලියාපදිංචි කළ අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |

..............................................................

ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්

අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

ඇමුණුම 06

<u>ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව</u>

**(1) විෂයභාර නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතුවේ.**

I. දිස්ත්‍රික්කය - ..........................................................................

II. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය -..........................................................................

III. ග්‍රාම නිලධාරි වසම -..........................................................................

IV. පිඹුරු අංකය -..........................................................................

V. කැබලි අංකය -..........................................................................

VI. ඉඩමේ ප්‍රමාණය(හෙක්ටයාර්) -..........................................................................

VII. පළාත් පාලන බල ප්‍රදේශයේ අවම අනුබෙදුම් සීමාව -..........................................................................

VIII. අවසර පත්‍ර/ දීමනා පත්‍ර අංකය -..........................................................................

IX. අවසර පත්‍රකරුගේ / දීමනා පත්‍රකරුගේ සම්පූර්ණ නම -..........................................................................
..........................................................................................................................

X. නාගරික බල ප්‍රදේශයක් ලෙස ගැසට් කර තිබේ ද - ඔව්/නැත

XI. එසේ නම් ඒ කවදාද? - ..................................................

**(2) ක්ෂේත්‍ර නිලධාරි විසින් පහත කරුණු සම්පූර්ණ කළ යුතුය.**

I. ක්ෂේත්‍ර පරීක්ෂණය කළ දිනය - ..........................................................................

II. ඉඩම භුක්ති විඳිනු ලබන්නේ අවසර පත්‍ර කරු / දීමනා පත්‍රකරු විසින් ද? - ...................................

III. ඉඩම භුක්ති විඳිනු ලබන්නේ අවසර පත්‍රකරුගේ / දීමනා පත්‍රකරුගේ උරුමකරුවන් නම් ඔවුන්ගේ

| නම | අවසර පත්‍රකරුට / දීමනා පත්‍රකරුට ඇති ඥාතීත්වය | වයස (අවු.) | ජාතික හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

උරුමකරුවන් නොවේ නම්

| නම | ඉඩම ලැබුණ ආකාරය |
| --- | --- |
| 1. ............................................................ | ............................................................ |
| 2 . ............................................................ | ............................................................ |

IV. ඉඩමේ භාවිතය කෙසේද

*නේවාසික - ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව හා පදිංචි පවුල් සංඛ්‍යාව ................

*කෘෂිකාර්මික - වගාවේ ස්වභාවය

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

V. අවසර පත්‍රය / දීමනා පත්‍රය බැහැර කර ඇති අරමුණින් පරිබාහිරව වාණිජ භාවිතයක් සඳහා යොදාගෙන ඇති බවට නිරීක්ෂණය වේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර -

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

<u>ඉඩමේ විස්තර</u>

උතුරට - ............................................................

නැගෙනහිරට - ............................................................

දකුණට - ............................................................

බටහිරට - ............................................................

ක්ෂේත්‍ර නිලධාරිගේ නිර්දේශය

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

................................................

අත්සන

................................................

නම හා තනතුර

ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

1. මෙම ඉඩම සඳහා ...................................................... මහතා /මියට නිදහස් ප්‍රදාන පත්‍රයක්/ දීමනා පත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

....................................

දිනය

..................................................................

ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම් අත්සන

ඇමුණුම 07

මගේ අංකය - ............................................
දෙදහස්...............................මස................දින,
.................................................. කාර්යාලයේ දීය.

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

...................................

1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින් හා 2022 අංක 11 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) / 19 (4) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය/දීමනා පත්‍රය හිමිකම වැඩසටහන යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත රජයට භාරදීම සඳහා වන එකඟතාවය පළකිරීම

..........................................................පළාතේ.........................................................දිස්ත්‍රික්කයේ,...........
.......................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ...................................................ග්‍රාම නිලධාරි වසමේ, ..................................................................................................................... ලිපිනයේ පදිංචි මාගේ.......................................... වන .......................................................................... යන අය විසින් ඔහු/ඇය වෙත ලැබී ඇති .......................................අංක දරන දීමනා පත්‍රයේ/අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි ඉවත් කර 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීමේ එකඟතාවය මත එකී ...................................... අංක දරන දීමනා පත්‍රය ස්වකීය කැමැත්තෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට භාරදීම තුළින් පහත අත්සන් තබන මා/අප සතුව එම ඉඩම සඳහා පැවති අයිතිවාසිකම සහ නැවත මා/අප වෙත නොමිලේ රජයේ ඉඩමක් ඉල්ලුම් කිරීමට ඇති හැකියාව අහිමි වන බව දැනගෙන එය පිළිගනිමින් ඒ සඳහා එකඟ වන බවට ප්‍රකාශ කරමි.

එකඟතාවය පළ කරන අයගේ විස්තරය

| නම | අවසර පත්‍රකරු/දීමනා පත්‍රකරු සමග ඇති ඥාතිත්වය | අත්සන | ජා.හැ.ප. අංකය |
|---|---|---|---|
| ..................................... | ........................................... | ............................. | ..................................... |
| ..................................... | ........................................... | ............................. | ..................................... |
| ..................................... | ........................................... | ............................. | ..................................... |
| ..................................... | ........................................... | ............................. | ..................................... |
| ..................................... | ........................................... | ............................. | ..................................... |

ඉහත ප්‍රකාශය අද දින මා ඉදිරියේ දී සිදු කරන ලදී.

.......................................................

ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/

අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
011 279 7400
011 286 4051

මගේ අංකය / எனது இல / My No. } ඉ.කො.ජ/පර් හා සං/e-Slims/02/11  ඔබේ අංකය / உமது இல / Your No }  දිනය / திகதி / Date } 2025.10.17

සියළුම පළාත්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරුන්

**ඉ.කො.ජ.2025/02 චක්‍රලේඛයට සමගාමීව e-Slims පද්ධතිය මගින් කටයුතු කිරීමට අදාළ උපදෙස් මාලාව**

**1.සියලු අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පද්ධතිය හරහා යොමු කිරීම**

මෙහිදී ප්‍රධාන වශයෙන් අයදුම්පත්‍ර කොටස් දෙකක් හදුනා ගැනීමට හැකියාව ඇත.

- ඉ.සං.ආ දීමනාපත්‍ර අයදුම්පත්‍ර
- නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමට යොමුකර ඇති අයදුම්පත්‍ර

ඉහත ක්‍රම දෙක හරහාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත්‍ර යොමු කර ඇති අතරම, එම අයදුම්පත්‍ර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයන් හි විවිධ අවස්ථාවන්හි පවතින බව හදුනාගෙන ඇති බැවින් මේ වන විට එම අයදුම්පත් පවතින කාර්යාලයන් විසින් ආපසු හරවා යැවීමට කටයුතු කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට යොමු වී ඇති අයදුම්පත්‍ර e-Slims පද්ධතිය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමට යොමු කරනු ලැබේ.

**1.1 පළාත් ඉඩම් කොමසාරිස්දෙපාර්තමේන්තුවට ලැබී ඇති අයදුම්පත්‍ර**

පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයන්හි පවතින අයදුම්පත්‍ර අදාළ විෂය නිලධාරී (PMA) ගිණුමෙන්, පළාත් සහකාර ඉඩම් කොමසාරිස් (APLC) හෝ පළාත් ඉඩම් කොමසාරිස් (PLC) පරිශීලක ගිණුමට යොමුකර එමගින් එම අයදුම්පත්‍ර නැවතත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමට යොමු කළ යුතුවේ.

**1.2 අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයට ලැබී ඇති අයදුම්පත්‍ර**

අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයන්හි පවතින අයදුම්පත්‍ර අදාළ විෂය නිලධාරී (IPMA) ගිණුමෙන් අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් (APLC) හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් (IPLC) පරිශීලක ගිණුමට යොමුකර එමගින් එම අයදුම්පත්‍ර නැවතත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමට යොමු කළ යුතුවේ.

ආයතන / நிர்வாகம் / Admin 011 279 7479 / 011 287 3033 | ඉඩම් බදු / காணி குத்தகை / Land Lease 011 279 7423 / 011 287 3110 | පර්යේෂණ හා සංවර්ධන / ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி / Research & Development 011 2874025 / 011 287 3812 | ප්‍රතිපත්ති හා විමර්ශන / கொள்கை மற்றும் விசாரணை / Policy & Investigation 011 279 7423 / 011 287 3110 | ගිණුම් / கணக்கு / Accounts 011 287 5833 / 011 286 4462
ඊ-මේල් ஈ-மெயில் E-mail – lcglandcom@gmail.com
වෙබ් ලිපිනය இணையம் Web Address – www.landcom.gov.lk

**1.3 ප්‍රාදේශීය ලේකම් ගිණුම (ORDS) වෙත ලැබී ඇති අයදුම්පත්‍ර**

ප්‍රාදේශීය ලේකම් (ORDS) පරිශීලක ගිණුමට හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් (ORSD) පරිශීලක ගිණුමට ලැබී ඇති අයදුම්පත්‍ර නැවතත් ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමට යොමු කළ යුතුවේ.

ඉහත අනු අංක 1.1 සිට 1.3 මගින් නැවත යොමුවන අයදුම්පත් ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ සිහිකැඳවීම් (Notification) තීරුවේ ,

i. ප්‍රතික්ෂේපිත ඉ. සං. ආ. දීමනා පත්‍ර අයදුම්පත් (සංශෝධනය කිරීම සඳහා)
ii. උරුමය දෙවැනි අදියර - ප්‍රතික්ෂේපිත නිදහස් දීමනාපත්‍ර අයදුම් පත්‍ර (සංශෝධනය කිරීම සඳහා)

නිරීක්ෂණය කිරීමේ හැකියාව ඇත.

**2. නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමේ නිර්දේශ යොමු කිරීම**

ඉහත අනු අංක 01 යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමුකරන ලද අයදුම්පත්‍ර,

i. ප්‍රතික්ෂේපිත ඉ. සං. ආ. දීමනා පත්‍ර අයදුම්පත් (සංශෝධනය කිරීම සඳහා)
ii. උරුමය දෙවැනි අදියර - ප්‍රතික්ෂේපිත නිදහස් දීමනාපත්‍ර අයදුම් පත්‍ර (සංශෝධනය කිරීම සඳහා)

යන ඉහත ආකාර දෙකෙන් කුමන ආකාරයේ පැවතුනද ඒ සඳහා පහත අයුරින් ක්‍රියාකළ යුතුය.

**2.1 නිදහස් දීමනාපත්‍ර සකස් කළ හැකි අයදුම්පත්‍ර**

**උරුමය දෙවැනි අදියර - ප්‍රතික්ෂේපිත නිදහස් දීමනාපත්‍ර අයදුම් පත්‍ර (සංශෝධනය කිරීම සඳහා)** යන ලැයිස්තුවේ පවතින අයදුම්පත්‍ර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව, 2025/02 චක්‍රලේඛය අනුව නිදහස් දීමනාපත්‍රයක් සකස් කිරීමේ හැකියාව පවතීනම්, ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ සිහිකැඳවීම් (Notification) තීරුවේ ඇති අදාළ අයදුම්පත්‍රය තෝරා එම අයදුම්පත්‍රය තුළ ඇති, **"මෙම හිමිකම අයදුම් පත්‍රය සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය"** යන ස්ථානයේ,

**" හිමිකම නිදහස් දීමනාපත්‍රය සකස් කිරීම නිර්දේශ කිරීම "**

යන කාරණය තෝරා චක්‍රලේඛය අනුව අදාළ නිර්දේශ වාර්තා ඇමුණුම් ලෙස ඇතුළත් කර "සුරැකීම" සිදුකළ විට එම අයදුම්පත ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත අනුමත කළ විට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත යොමු වේ.

**ප්‍රතික්ෂේපිත ඉ. සං. ආ. දීමනා පත්‍ර අයදුම්පත් (සංශෝධනය කිරීම සඳහා)** යන ලැයිස්තුවේ පවතින අයදුම්පත්‍ර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව, 2025/02 චක්‍රලේඛය අනුව නිදහස් දීමනාපත්‍රයක් සකස් කිරීමේ හැකියාව පවතීනම්, ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ සිහිකැඳවීම් (Notification) තීරුවේ ඇති අදාළ අයදුම්පත්‍රය තෝරා එම අයදුම්පත්‍රය තුළ ඇති, **"මෙම හිමිකම අයදුම් පත්‍රය සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය"** යන ස්ථානයේ,

**" හිමිකම නිදහස් දීමනාපත්‍රය සකස් කිරීම නිර්දේශ කිරීම "**

යන කාරණය තෝරා "සුරැකීම" සිදුකළ විට එම අයදුම්පත ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත අනුමත කළ විට නැවත ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ ඉඩම් බැහැර කිරීමේ අයිකනය තුළ **" හිමිකම"** අයිකනය හරහා අදාළ බලපත්‍රය තෝරා ඒ සඳහා හිමිකම නිදහස් දීමනාපත්‍ර අයදුම්පත පුරවා, අදාළ නිර්දේශ වාර්තා ඇමුණුම් ලෙස ඇතුළත් කර "සුරැකීම" සිදුකළ විට එම අයදුම්පත ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත අනුමත කළ විට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත යොමු වේ.

## 2.2 ඉ.සං.ආ දීමනාපත්‍ර සකස් කළ හැකි අයදුම්පත්‍ර

**උරුමය දෙවැනි අදියර - ප්‍රතික්ෂේපිත නිදහස් දීමනාපත්‍ර අයදුම් පත්‍ර (සංශෝධනය කිරීම සඳහා)** යන ලැයිස්තුවේ පවතින අයදුම්පත්‍ර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව, 2025/02 චක්‍රලේඛය අනුව නිදහස් දීමනාපත්‍රයක් සකස් කිරීමේ හැකියාව පවතීනම්, ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ සිහිකැඳවීම් (Notification) තීරුවේ ඇති අදාළ අයදුම්පත්‍රය තෝරා එම අයදුම්පත්‍රය තුළ ඇති, **"මෙම හිමිකම අයදුම් පත්‍රය සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය"** යන ස්ථානයේ,

**"ඉ.සං.ආ දීමනාපත්‍රය සකස් කිරීමට හැකියාව පවතී**

යන කාරණය තෝරා "සුරැකීම" සිදුකළ විට එම අයදුම්පත ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත සහතික කළ විට නැවත ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ ඉඩම් බැහැර කිරීමේ අයිකනය තුළ **" ඉ.සං.ආ දීමනාපත්‍ර අයදුම්පත"** අයිකනය හරහා අදාළ බලපත්‍රය තෝරා ඒ සඳහා **ඉ.සං.ආ දීමනාපත්‍රය සකස් කිරීම** අයදුම්පත පුරවා, අදාළ නිර්දේශ වාර්තා ඇමුණුම් ලෙස ඇතුළත් කර "සුරැකීම" සිදුකළ විට එම අයදුම්පත **ඉ.සං.ආ දීමනාපත්‍ර සකස් කිරීමේ අයදුම්පත්‍රයක්** ලෙස ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත අනුමත කළ විට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත යොමු වේ.

**ප්‍රතික්ෂේපිත ඉ. සං. ආ. දීමනා පත්‍ර අයදුම්පත් (සංශෝධනය කිරීම සඳහා)** යන ලැයිස්තුවේ පවතින අයදුම්පත්‍ර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව, 2025/01 චක්‍රලේඛය අනුව නිදහස් දීමනාපත්‍රයක් සකස් කිරීමේ හැකියාව පවතීනම්, ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ සිහිකැඳවීම් (Notification) තීරුවේ ඇති අදාළ අයදුම්පත්‍රය තෝරා එම අයදුම්පත්‍රය තුළ ඇති, **"මෙම හිමිකම අයදුම් පත්‍රය සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය"** යන ස්ථානයේ,

**"ඉ.සං.ආ දීමනාපත්‍රය සකස් කිරීමට හැකියාව පවතී**

යන කාරණය තෝරා චක්‍රලේඛය අනුව අදාළ නිර්දේශ වාර්තා ඇමුණුම් ලෙස ඇතුළත් කර "සුරැකීම" සිදුකළ විට එම අයදුම්පත **ඉ.සං.ආ දීමනාපත්‍ර සකස් කිරීමේ අයදුම්පත්‍රයක්** ලෙස ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත අනුමත කළ විට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය හරහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවවෙත යොමු වේ.

## 2.3 ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසු ඉ.සං.ආ දීමනාපත්‍ර නැවත භාරදීම සිදු කරන අයදුම්පත්‍ර

ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව, 2025/02 චක්‍රලේඛය අනුව හිමිකම නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමේ හැකියාව නොමැති අයදුම්පත්‍ර පවතීනම්, ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී (LO) පරිශීලක ගිණුමට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය නිලධාරී (ORLM) පරිශීලක ගිණුමේ සිහිකැඳවීම් (Notification) තීරුවේ ඇති අදාළ අයදුම්පත්‍රය තෝරා එම අයදුම්පත්‍රය තුළ ඇති **"මෙම හිමිකම අයදුම් පත්‍රය සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය"** යන ස්ථානයේ,

**"දීමනාපත්‍රය නැවත හිමිකරු වෙත භාරදීම නිර්දේශ කිරීම"**

යන කාරණය තෝරා “සුරැකීම” සිදුකළ විට එම අයදුම්පත ප්‍රාදේශීය ලේකම් ගිණුමට යොමු වේ. එවිට ප්‍රාදේශීය ලේකම් ගිණුමෙන් එම අයදුම්පත අනුමත කළ එම අයදුම්පත්‍රය හිමිකම මොඩියුලයෙන් ඉවත්වීම සිදු වේ.

**3. ඕ රේඛා චිත්‍ර අවලංගු කිරීම සහ භාරගත් දීමනාපත්‍රය නැවත යොමු කිරීම**

ඉහත අනු අංක 3.3 යටතේ නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමට හැකියාව නොමැති අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් පද්ධතිය හරහා සහතික කළ පසු එම අයදුම්පත්‍රවලට අදාළ බලපත්‍රය හෝ දීමනාපත්‍රය නැවත බලාත්මක කර 2025/02 චක්‍රලේඛය අනුව නැවත පුද්ගලයාට භාරදීම කළයුතුය.

**3.1 භාරගත් දීමනාපත්‍රය නැවත යොමු කිරීම සහ “ඕ” රේඛා චිත්‍ර අවලංගු කිරීමට යොමු කිරීම**

ඉහත අනු අංක 3.3 යටතේ අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් පද්ධතිය හරහා සහතික කළ පසු එම අයදුම්පත්‍රයට අදාළව දීමනාපත්‍රය නැවත ප්‍රාදේශීය ලේකම්වෙත යොමු කිරීම සඳහා සහ අවලංගු කළයුතු “ඕ” රේඛා චිත්‍ර මිනින්දෝරු කාර්යාල වෙත යොමු කිරීම සඳහා අදාළ සිහිකැඳවීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ විෂය නිලධාරී ගිණුමට (MA) යොමු වේ.

එහිදී එම දීමනාපත්‍රය ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකළ දිනය හා අදාළ “ඕ” රේඛා චිත්‍රය අවලංගු කිරීම සඳහා යොමුකළ දිනය පද්ධතියේ අයදුම්පතට ඇතුළත් කර සුරැකීම කළයුතුය.

**3.2 “ඕ” රේඛා චිත්‍ර අවලංගු කිරීම**

එවැනි අයදුම්පත්‍රවල “ඕ” රේඛා චිත්‍රය අවලංගු කිරීමට අවශ්‍යනම් ඒ පිළිබඳ සිහිකැඳවීම මිනිදෝරු දෙපාර්තමේන්තුවේ MTO පරිශීලක ගිණුම යොමු වේ. එහිදී පද්ධතියට මීට පෙර යොදා තිබූ “ඕ” රේඛා චිත්‍රය අවලංගු කර අදාළ “ඕ” රේඛා චිත්‍ර අංකය ඉවත් කළ යුතුය.

චන්දන රණවීර ආරච්චි

ඉඩම් කොමසාරිස් ජනරාල්